# ජාතික තරුණ සේවා සභාව
## தேசிய இளைஞர் சேவைகள் மன்றம்
## NATIONAL YOUTH SERVICES COUNCIL


මගේ අංකය :-
எனது இல :- NYSC/DG-Gen/2023
My No :-

ඔබේ අංකය :-
உமது இல :-
Your No :-

දිනය :-
திகதி :- 2023.10.27
Date :-

UNIVERSITY GRANTS COMMISSION
31 OCT 2023
CHAIRMAN

To: All VCs

31/10/2023

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා,
සභාපති,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
නො.20,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.

සභාපතිතුමනි,

**ජාතික යොවුන් දේශගුණික ක්‍රියාදාමයේ සමාරම්භක උත්සවය වෙනුවෙන් පැවැත්වීමට අපේක්ෂිත දේශගුණික ක්‍රියාකාරී උද්‍යාන සැලසුම් නිර්මාණ සහ කෙටි චිත්‍රපට තරඟාවලිය සම්බන්ධව.**

ශ්‍රී ලාංකේය තාරුණ්‍ය දේශගුණික විපර්යාසයන් හමුවේ ඇතිවන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම උදෙසා සවිබල ගැන්වීමේ සහ තරුණ නායකයන් හට පාරිසරික ගැටළු කතිකා කිරීමට මෙන්ම එම ගැටළු සඳහා නව්‍ය විසඳුම් සොයා තාරුණ්‍යයේ අදහස් බෙදාහදා ගැනීමට අවස්ථාව සලසන වේදිකාවක් නිර්මාණය කිරීමේ අපේක්ෂාවෙන් යුතුව ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ උපදෙස් මත නිර්මාණිත "ජාතික යොවුන් දේශගුණික ක්‍රියාකාරී සංසදය" දියත් කිරීමේ සමාරම්භක උත්සවය 2023 වර්ෂයේ නොවැම්බර් මස 05 වන දින පැවැත්වීමට අපේක්ෂිතය.

ඒ අනුව මෙම සමාරම්භක උත්සවය උදෙසා පහත සඳහන් අංශ යටතේ අන්තර් විශ්ව විද්‍යාලීය සිසු/සිසුවියන් සඳහා තරඟාවලි පැවැත්වීමට යෝජිත අතර, 2023/11/05 දින ප.ව 07.00ට **Nelum Hall, Waters Edge** පරිශ්‍රයෙහිදී ආරම්භ වීමට නියමිත මෙම සමාරම්භක උළෙල සඳහා පහත තරඟ අංශ නියෝජනය කරමින් රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සිසු/සිසුවියන් පස්දෙනෙකු සහ ආචාර්යවරයෙකු බැගින් වූ කණ්ඩායම් සහභාගී කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**01. දේශගුණික ක්‍රියාකාරී උද්‍යාන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් ජාතික තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය දේශගුණික ක්‍රියාකාරී උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සැලසුම් නිර්මාණය කිරීමේ තරඟාවලිය.**

**02. දේශගුණික විපර්යාස පිළිබඳ කෙටි චිත්‍රපට තරඟාවලිය**

තවද, මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීමට අවශ්‍යවන්නේ නම් පහත විස්තර සඳහන් අපගේ නිලධාරීතුමන් හා සම්බන්ධ විය හැකි බව කාරුණිකව දන්වමි.

❖ බෝධි මාතුර මහතා - පෞද්ගලික ලේකම් (සභාපති/අධ්‍යක්ෂ ජනරාල්)
දුරකථන අංකය - 076 6155259
විද්‍යුත් තැපැල් ලිපිනය - privatesecretary@nysc.lk

තාරුණ්‍ය උදෙසා සිදුකරන මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා ඔබතුමන් ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

පසිඳු ගුණරත්න.
තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති


ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විளையாட்டு மற்றும் இளைஞர் விவகார அமைச்சகம் Ministry of Sports & Youth Affairs

අංක 65, හයිලෙවල් පාර, මහරගම
இல 65, ஹய்லெவல் வீதி, மஹரகம
No 65, High Level Rd, Maharagama

දුරකථන / தொலைபேசி / Telephone: Chairman / Director General +94 112 850990; Office +94 112 850986

ෆැක්ස් / தொலைநகல் / Fax: Chairman / Director General +94 112 850991; Office +94 112 847565

Email : chairman@nysc.lk
Web : www.nysc.lk